# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2066/14 – 2018 අප්‍රේල් 10 වැනි අඟහරුවාදා – 2018.04.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම කෝරළේ සුළු කොට්ඨාසයේ, වල්ලිවල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2016.02.10 වැනි දින පිළියෙල කරන ලද ප්‍රගමන අනුරේඛන අංක එම්ආර්/ඩබ්ලිව්එල්ජී/2015/597 හි කැබලි අක්ෂර 'ඒ' ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0986 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අක්ෂර 'ඒ' – ඒකල කප්පරතොට පාර, වරි. අංක 118හි කොටසක් හෙවත් ඒකල දකුණු බස්නාහිර කැබැල්ල – ප්‍රමාණය: හෙක්. 0.0986**

උතුරට: මුපි මාර 181හි කැබලි අංක 7; නැගෙනහිරට: මුපි මාර 181හි කැබලි අංක 7,3,4, හිමිකම් කියන අය සොයාගත නොහැකි ඇළෙන් එගොඩහ වත්ත සහ චන්ද්‍රසිරි අලවත්ත හිමිකම් කියන ඒකල දකුණු බස්නාහිර කැබැල්ල; දකුණට: චන්ද්‍රසිරි අලවත්ත හිමිකම් කියන ඒකල දකුණු බස්නාහිර කැබැල්ල; බටහිරට: චන්ද්‍රසිරි අලවත්ත හිමිකම් කියන ඒකල දකුණු බස්නාහිර කැබැල්ල, හිමිකම් කියන අය සොයාගත නොහැකි වල්ලිවලවත්ත, මුපි මාර 181හි කැබලි අංක 9,10 සහ 7.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

යොමු අංකය: 4-3/6/2015/එච්ඩබ්ලිව්/218.
2017 නොවැම්බර් මස 27 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

04-852


1A – G27439 – 17 (2018/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*